**ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය**

**කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**

# ජාතික කාන්තා බලමණ්ඩල ව්‍යවස්ථාව

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි**

| | |
|---|---|
| බලමණ්ඩලයේ නම | |
| ලියාපදිංචි අංකය | |
| ලියාපදිංචි දිනය | |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| GBV | ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වූ ප්‍රචණ්ඩත්වය |
| කාන්තා, ළමා කටයුතු අමාත්‍යාංශය | කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය |
| කාන්තා කාර්යාංශය | ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය |
| ප්‍රා.ලේ | ප්‍රාදේශීය ලේකම් |
| ග්‍රා.නි | ග්‍රාම නිලධාරී |
| කාන්තා කාර්ය සංවිධාන | කාන්තා කාර්ය සංවිධානය |
| ව.සං.නි | වනිතා සංවර්ධන නිලධාරී |
| ව.සං.ක්ෂේත්‍ර.ස | වනිතා සංවර්ධන ක්ෂේත්‍ර සහකාර |

## 1. ජාතික කාන්තා බලමණ්ඩලය පිහිටුවීමේ අරමුණ හා මෙහෙවර

(1) ජාතික කාන්තා බලමණ්ඩලය (මින් මතු ‘"බලමණ්ඩලය"ලෙස හැඳින්වේ.) පිහිටුවා ඇත්තේ කාන්තා කාර්ය සංවිධාන (මින් මතු ‘"කාන්තා කාර්ය සංවිධන"’ ලෙස හැඳින්වේ.) මඟින් ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය උදෙසා සක්‍රීය දායකත්වයක් සැපයීම සඳහාය. “බලමණ්ඩලය” මඟින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරන අතර කාන්තාවන්ගේ හඬ ජාතික හා ජාත්‍යන්තරතලයේ ඇසීමට ලක් කිරීම හා රටෙහි ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය තුළ ඔවුනගේ අවශ්‍යතා පිළිබිඹු කිරීමට කටයුතු කිරීමටත්ය.

(2) “බලමණ්ඩලය” විසින් සාමාජීය, ආර්ථික හා සංස්කෘතික හරයන් සඳහා කටයුතු කරන අතර ඔවුනගේ අවශ්‍යතා ජාතික ප්‍රතිපත්ති, නීති හා සංවර්ධන න්‍යායපත්‍ර තුළ පිළිබිඹු කිරීමට කටයුතු කෙරේ.

(3) “බලමණ්ඩලය” යනු සියළුම දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩලවල නියෝජිත කණ්ඩායමක් වන අතර එනම්, එකී කණ්ඩායම් ශ්‍රී ලංකාවේ සියළුම ලියාපදිංචි ‘"කාන්තා කාර්ය සංවිධන" වල නියෝජිතයන් වේ.

(4) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය (මින් මතු ‘"කාන්තා කාර්යාංශය"’ලෙස කියවේ.) මඟින් කාන්තා කාර්යාංශවලට අදාළ අභියෝග ජයගැනීම මෙන්ම බලමණ්ඩලවල සහයෝගයෙන් එම සංවිධානවල අවශ්‍යතා උකහා ගැනීමට අවස්ථාව සලසා දෙයි.

(5) “බලමණ්ඩලය” මඟින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් බලමණ්ඩලවලට අවශ්‍ය සේවාවන් හා සම්බන්ධීකරණය උදෙසා පාලමක් සේ හිඳ කටයුතු කරයි.

## 2. කාර්යයන්

ජාතික කාන්තා බලමණ්ඩල මූලික කාර්යන් පහත පරිදිවේ;

(1) ශ්‍රී ලංකාවේ සියලු කාන්තා කාර්ය සංවිධාන ක්‍රියාකාරී කරවීමට අවශ්‍ය මඟගැන්වීම සහ සහයෝගය ලබාදීමට "කාන්තා කාර්යාංශය" සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම.

(2) ජාතික මට්ටමේ කාන්තා සංවර්ධනය සඳහා මුල්‍ය හා වෙනත් සම්පත් ලබාගැනීම පිණිස සක්‍රියව කටයුතු කිරීම හා ලබාගත් හා වෙන්කළ මුදල් හා සම්පත්, සියලුම කාන්තා කාර්ය සංවිධාන කාර්යන් සඳහා සාධාරණව හා සෘජුවම බෙදාදීම.

(3) බලමණ්ඩලයේ කටයුතු අධීක්ෂණය හා පාලනය සඳහා "කාන්තා කාර්යාංශය" සමඟ ඉතා කිට්ටු සම්බන්ධීකරයක් පවත්වාගෙන යාම.

(4) දිස්ත්‍රික්, කොට්ඨාසයේ හා ග්‍රාමීය මට්ටමේ කාන්තාවනට ඇති ප්‍රමුඛතා මෙන්ම ඔවුනට ඇති අවශ්‍යතා හා ගැටළුවලට විසඳුම් හඳුනාගැනීම. නොඑසේනම් එකී කරුණු අවශ්‍යතා අනුව ජාතික මට්ටමේ මෙන්ම ජාත්‍යන්තර ආයතනවල අවධානය සඳහා ඉදිරිපත්කර විසඳුම් ලබාගැනීම.

(5) දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ යෝජනා විශ්ලේෂණය කිරීම හා අධීක්ෂණය කිරීම මෙන්ම ජාතික මට්ටමේ ගනු ලැබූ තීරණ හා ක්‍රියාකාරකම් '"කාන්තා කාර්ය සංවිධන" මගින් ක්‍රියාත්මක කිරීම.

(6) කාන්තාවන්ගේ විමුක්තිය, යහජීවන තත්වය, නිදහස සහ ප්‍රචණ්ඩත්වයෙන් තොරවීම මෙන්ම සිය මූලික අයිතිවාසිකම් භුක්තිවිඳීම උදෙසා විවිධ බලමුළුවල ඔවුනගේ අයිතීන්, අභිමානය හා අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම.

(7) "කාන්තා කාර්යාංශය" හා ඒකාබද්ධව ජාතික මට්ටමේ හා ජාත්‍යන්තර මට්ටමේ ආයතනවල සමුළු, රැස්වීම්, සාකච්ඡා හා වැඩමුළු සඳහා සක්‍රිය සහභාගිත්වය ලබාගැනීම/ ලබාදීම හා කාන්තාවන් වෙනුවෙන් එම බලමුලුවල කටයුතු කිරීම.

## 3. මහා සභාව

(1) මහා සභාව අවම වශයෙන් මාස තුනකට එක් සැරයක්වත් පැවැත්වීම.

(2) අවම වශයෙන් දිස්ත්‍රික් කාන්තා බලමණ්ඩලවල (සභාපති, ලේකම් හෝ භාණ්ඩාගාරික) යන නිළධාරීන්ගෙන් දෙදෙනෙකුවත් සහභාගී වීම අනිවාර්යය වේ.

(3) තීරණ ගැනීමේදී සාමාජිකාවන් 2/3ක සහභාගීත්වයක් තිබිය යුතුය.

(4) මහා සභාවේදී බලමණ්ඩල මූල්‍යප්‍රගතිය භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළයුතු අතර එහි පිටපතක් "කාන්තා කාර්යාංශය" වෙත ඉදිරිපත් කළ යුතුය.

## 4. කාරක සභාව සහ නිළධාරී මණ්ඩලය

ජාතික කාන්තා බලමණ්ඩලය සඳහා කාරක සභාවක් තිබිය යුතු අතර, එමඟින් සියළුම පරිපාලනය, කළමනාකරණ කාර්යයන්, සම්මේලනය වෙනුවෙන් සුදුසු තීරණ ගැනීම, කාන්තාවන්ට අදාළ ප්‍රතිපත්ති සඳහා මූලපිරීම්, සම්මේලනයේ අනාගතය පිළිබඳ සාකච්ඡා කිරීම සහ මහා සභාවවට අදාල කටයුතු සාකච්ඡා කිරීමට හැකියාව ඇත. මෙම කමිටුව නිලවරණයෙන් තේරී පත් වූ නිලධාරීන් 8 දෙනකුගෙන් (පස් දෙනකු තනතුරු සහ තවත් සාමාජිකයන් තිදෙනකුගෙන්), උපදේශිකාවන් දෙදෙනකුගෙන් සහ කාන්තා කාර්යාංශයෙන් පත් කළ එක් නිලධාරිනිකගෙන් සමන්විත වේ.

නිලධාරී මණ්ඩලයේ වගකීම් පහත පරිදි වන අතර එම වගකීම්වලට ම සීමාවිය යුතු නොවේ.

**(1) සභාපති**

- මහසභා රැස්වීම හා කාරක සභා රැස්වීම් මුලසුන හොබවයි
- සියලුම රැස්වීම් වාර්තා හා වෙනත් රැස්වීම් වාර්තා සත්‍යාපනය කරයි

- ජාතික කාන්තා බලමණ්ඩලය නියෝජනය කරනු ලබන අතර එහි කටයුතු ව්‍යවස්ථානුකූලව නියමාකාරයෙන් ක්‍රියාත්මක කරනු ලබයි සහ
- ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයට අවශ්‍ය සන්නිවේදනය හා වාර්තා කිරීම සිදු කරයි

**(2) උපසභාපති**

- සභාපතිනියට ඇගේ කටයුතු හා  වගකීම් මනාව කළමනාකරණය කරගැනීමට සහය වේ.
- සභාපතිනිය නොපැමිණි විටකදී ඇගේ කාර්යභාරය ඉටු කරනු ලබයි

**(3) ලේකම්**

- මහා සභාවේ හා කාරක සභාවේ රැස්වීම් වාර්තා සැකසීම
- පැමිණීමේ ලේඛන සැකසීම, ලොග් පොත නඩත්තු කිරීම හා ප්‍රගති වාර්තා සැකසීම
- ලියාපදිංචි සාමාජිකාවන්ගේ නාම ලේඛනය නඩත්තු කිරීම
- ඉහත ලේඛන හා වාර්තා ක්‍රමානුකූලව හා ආරක්ෂිතව තබා ගැනීම
- සාමාජිකාවන් කැඳවීම සඳහා කැඳවීම් ලිපි යැවීම හා
- ජාතික කාන්තා බලමණ්ඩල තොරතුරු රේඛිය ආයතන, ජාතික හා ජාත්‍යන්තර සංවිධාන වෙත යොමු කිරීම හා බලමණ්ඩලයට අදාල සංවිධානය සන්නිවේදනය ක්‍රමානුකූලව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම

**(4) සහකාර ලේකම්**

- ලේකම්තුමියගේ කටයුතු පවත්වාගෙන යාමට සහය වීම
- ලේකම්තුමිය නොමැතිවිටදී ඇයගේ රාජකාරී කටයුතු සිදු කිරීම

**(5) භාණ්ඩාගාරික**

- සමිතියේ සියලු මුල්‍ය ගනුදෙනු වාර්තා කිරීම එනම් මුදල් ලැබීම්/ ගිණුම් පොත් හා මුදල් පොත නඩත්තු කිරීම
- සුළු මුදල් මූල්‍ය ලේඛන සුදුසු පරිදි හා ආරක්ෂිතව පවත්වා ගෙන යාම
- අනුමැතිය ඇති සුළු මුදල් සීමාව ඉක්මවා යන සියලු බලමණ්ඩල මුදල් බැංකු ගත කිරීම
- කාන්තා කාර්ය සංවිධානවල තැන්පතු ගාස්තුව එකතු කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකසා එයට කාරක සභාවේ හා මහාසභාවේ අනුමැතිය ලබා ගැනීම
- ජාතික මට්ටමේ වාර්ෂික විගණනයට ප්‍රතිචාර දැක්වීම,
- බලමණ්ඩල සියලු ලේඛන හා වාර්තා මුද්‍රිත මාධ්‍යයෙන් පවත්වා ගැනීම අනිවාර්ය වේ

**(6) අනෙක් කමිටු සාමාජිකාවන් 3 දෙනා**

ඉහත සඳහන් කර නොමැති තනතුරු සහිත තවත් කමිටු සාමාජිකයින් තිදෙනෙකු සිටිය යුතු නමුත් ඔවුන් තම දැනුම සහ කුසලතා සමඟ කමිටු කටයුතු සඳහා  දායක වීමට අපේක්ෂා කෙරේ.

**(7) උපදේශකයන් දෙදෙනෙක්**

- ශ්‍රී ලංකාවේ කාන්තාවන් සවිබල ගැන්වීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය උදෙසා ඉහළ දායකත්වයක් ලබා දෙන කාන්තාවන් පස් දෙනෙකු සම්මේලනයේ උපදේශකයන් ලෙස කාන්තා කාර්යාංශය විසින් නම් කෙරේ. එම පස්දෙනාගෙන් දෙදෙනෙක් කාරක සභා සාමාජිකත්වයට පත් කළ යුතුය.
- ඔවුන්ට ඉහත දක්වා ඇති කාරක සභා තනතුරු දැරීමට නොහැකි නමුත් කමිටු සාකච්ඡා සඳහා අවශ්‍ය උපදෙස් ලබා දිය හැකිවේ.

**(8) අධ්‍යක්ෂ, ශ්‍රීලංකාකාන්තා කාර්යාංශය**

- බලමණ්ඩලය කටයුතු අධීක්ෂණය හා මෙහෙයුම් කරනු ලබයි.
- බලමණ්ඩලයට අවශ්‍ය උපදේශකයින් පස් දෙනෙකු පත් කරයි.
- අධ්‍යක්ෂ ඇය/ඔහු හෝ ඇය/ඔහුගේ නම් කරන ලද නිලධාරියා කාරක සභාවට සහභාගී වේ.

**(9) කාන්තා, ළමා කටයුතු හා සමාජ බලගැන්වීම් අමාත්‍යාංශය ගණකාධිකාරී (විගණක)**

බලමණ්ඩලයේ අභ්‍යන්තර විගණක ලෙස මූල්‍ය/ ගිණුම්කරණය පිළිබඳ උපදෙස් ලබාදේ.

ඉහත තනතුරු සඳහා සුදුසු පුද්ගලයින් මහාසභා රැස්වීමකදී ඡන්දයකින් තේරී පත් වේ. මෙකී තනතුරුවල සේවා කාලය වසරක් පමණ වේ.

(අ) බලමණ්ඩලයේ සාමාජිකාවන්ට ඇයවම අපේක්ෂකයා ලෙස හෝ වෙනත් අයවලුන් අපේක්ෂකයන් ලෙස නිර්දේශ කල හැකිය

(ආ) අපේක්ෂිකාවක් වීමට අපේක්ෂා කරන අයෙකු අවම වශයෙන් මාස 6 ක් කාන්තා කාර්ය සංවිධානයේ සාමාජිකාවක විය යුතුය

(ඇ) ඇතැම්විට එකම අපේක්ෂිකාව එම තනතුරට තේරී පත්වුවහොත් ඇයගේ සේවා කාලය උපරිම වසර 2ක් පමණ වේ.

(ඈ) පෙර සිටි සමිති නිලධාරිනියන් වසර 2ක් සේවය කලත්, වෙනත් තනතුරක් සඳහා නිලවරණයට ඉරිදිපත්වීමට හැකියාවක් තිබේ. (කෙසේවුවත් එක නිලධාරිනයකගේ උපරිම තනතුරු දැරීමේ කාලය අවුරුදු 2 ක් පමණවේ).

(ඉ) බලමණ්ඩලය තනතුරු සඳහා දිස්ත්‍රික් බලමණ්ඩලවල සාමාජිකාවන් එක් අයෙක් තෝරාගැනීමට අවස්ථාව තිබේ.

(ඊ) ඡන්දය පවත්වනු ලබන්නේ රහස් ඡන්දයක් ලෙසය. එසේ වුවත් බලමණ්ඩලයේ සාමාජිකාවන් 10 කට අඩුවන විටදී අත ඔසවා ඡන්දය දීම වැනි සරල ක්‍රම භාවිතා කලහැකිය. බහුතර ඡන්ද ලබාගන්නා වූ සාමාජිකාව තේරී පත්වේ. ඡන්දය ගණන් කිරීම සිදු කරනු ලබන්නේ ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ හෝ ඇය/ ඔහුගේ බලය පැවරූ නිලධාරිනියක් විසිනි.

(උ) සම්පූර්ණ නිලවරණ ක්‍රියාවලිය කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂ හෝ ඇය/ඔහුගේ බලය පැවරූ නිලධාරිනියක් නිරීක්ෂණය කරනු ලබයි. නිලවරණ තොරතුරු කාන්තා කාර්යාංශ අධ්‍යක්ෂ විසින් අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කල යුතුය.

## 5. සාමාජිකත්වය අහිමි වීම

ජාතික බලමණ්ඩලයේ සාමාජිකත්වය පහත සඳහන් අවස්ථාවල අහෝසි විය හැකිය.

(1) කාන්තා කාර්ය සංවිධාන, ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික ව්‍යවස්ථා උල්ලංඝනය කිරීම.

(2) මූල්‍ය හා අනෙකුත් වංචාවලට සහභාගි වීම දිරිගැන්වීම

(3) බලමණ්ඩල කාර්යයන් නොසලකා පෞද්ගලික අභිමතාර්ථ අනුව කටයුතු කිරීම

(4) තම පෞද්ගලික දේශපාලන අරමුණු ඉටු කරගැනීමට අනෙකුත් සාමාජිකාවන් පොළඹවා ගැනීම

(5) නොකඩවා මාස 3 ක් (හේතු නොදන්වා) බලමණ්ඩල කටයුතු හා රැස්වීමවලට සහභාගී නොවීම

(6) කාන්තා කාර්ය සංවිධාන, ප්‍රාදේශීය, දිස්ත්‍රික් සහ ජාතික බලමණ්ඩල ප්‍රතිරූපයට හානි පැමිණවීම.

## 6. අරමුදල්

ජාතික බලමණ්ඩල අරමුදල් පහත පරිදි සැකසේ;

(1) රුපියල්1,000.00 සිට 7,500.00 දක්වා වූ පරාසයක සියලුම නියෝජිත කාන්තා කාර්ය සංවිධාන කාන්තා කාර්යාංශ සාමාජිකාවන්ගේ එනම් පළමු මහසභාරැස්වීමේදී තහවුරු කල සාමාජිකාවන්ගේ සාමාජික මුදල්.
(2) රජයේ, විදේශීය ආයතන, රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලික මගින් ලැබුණු ආධාර හා පරිත්‍යාග මෙන්ම ජාතික හා ජාත්‍යන්තර ආයතනවල ඇරයුමෙන් පවත්වාගෙන යන උපව්‍යාපෘති මගින්.
(3) ව්‍යවස්ථාවට අනුකූල වෙනත් ඕනෑම ප්‍රභවයකින් ලැබුණු මුදල්.

## 7. අයවැය හා ගිණුම්කරණය

(1) භාණ්ඩාගාරික විසින් බලමණ්ඩල වාර්ෂික අයවැය වර්ෂයේ මුලදී කාරක සභාව වෙත ඉදිරිපත් කෙරේ. සියලුම සාමාජිකාවන් මහා සභාවකදී අදාළ අයවැය සාකච්ජා කොට අවසන්කර එය අධ්‍යක්ෂ, කාන්තා කාර්යාංශයේ අනුමැතිය පිණිස ඉදිරිපත් කෙරේ.
(2) බලමණ්ඩලය නමින් විවෘත කරති බැංකු ගිණුම තුළ සියලු මුදල් තැන්පත්කල යුතුය. භාණ්ඩාගාරික විසින් කාරක සභාවේ අනුමැතිය ඇතිව බලමණ්ඩලයේ සියලු ලැබීම/ වියදම් කළමනාකරණය කරනු ලබන අතර බලමණ්ඩල ගිණුම නඩත්තු කරනු ලබයි.
(3) අනුමැතිය ලැබී ඇති සුළු මුදල් ප්‍රමාණය කළමනාකරණය භාණ්ඩාගාරික විසින් සිදු කෙරේ. භාණ්ඩාගාරික විසින් බලමණ්ඩල මුදල් ප්‍රවේසම් කිරීමට හා සියලු මුදල් සංසරණයන් මුදල් පොතේ සටහන් තබාගැනීම පිණිස කටයුතු කෙරේ. සුළු මුදල් ප්‍රමාණය කොතරම්ද යනවග බලමණ්ඩලය තීරණය කරනු ලබන අතර එය රුපියල් 20,000.00 නො ඉක්මවිය යුතුය.
(4) භාණ්ඩාගාරික විසින් බලමණ්ඩල මුදල් සංසරණ වාර්තා මුදල් පොතෙහි නඩත්තු කෙරේ.
(5) බලමණ්ඩල ගිණුම් හා මුදල් සංසරණයන් අධ්‍යක්ෂ, කාන්තා කාර්යාංශය මගින් හෝ බලයලත් විගණකවරයෙකු විසින් වසර අවසානෙදි විගණනය කරනු ලබයි. බලමණ්ඩල මූල්‍ය වාර්තා එනම් ලැබීම පොත, බැංකුපොත, සුළු මුදල්පොත ආදිය යම් හෙයකින් බලමණ්ඩලය විසින් වසර අවසානයේදී අධ්‍යක්ෂ, කාන්තා කාර්යාංශය වෙත භාරදීමට අපොහොසත් වන්නේ නම් බලමණ්ඩලය මාස 6ක් අවලංගු කල හැකිය. අවලංගු කරන කාලය තුල බලමණ්ඩලය වෙත කිසියම් හෝ රාජ්‍ය හෝ වෙනත් ආයතන මගින් ලබාදෙන ප්‍රදානයන් ලබාගැනීමට නොහැකි වේ.

(6) බලමණ්ඩලය මගින් ගෙවීම් කටයුතු සිදුකරන චෙක්පත්වලට අත්සන් තැබීමේ බලය භාණ්ඩාගාරික/ සභාපති හෝ උප සභාපති විසින් සිදුකෙරේ.

(7) බලමණ්ඩල විසින් සිදුකරන සියලු ලැබීම් හා ගෙවීම් සඳහා වන සියලු මූල්‍ය සංසරණයන් සඳහා රිසිට් පතක් නිකුත් කිරීම අනිවාර්යවේ.

(8) බලමණ්ඩලයේ මූල්‍ය තත්වය වර්ධනය කිරීම සඳහා විවිධ හා නීත්‍යානුකුල ක්‍රම මගින් මුදල් සංචිත වැඩිකර ගැනීම සඳහා බලමණ්ඩල අනෙකුත් සාමාජිකත්වයේ එකඟත්වයෙන් සිදුකල හැකිය.

## 8. දේශපාලන කටයුතු

(1) ජාතික බලමණ්ඩල මගින් කිසියම් හෝ පක්ෂයක හෝ පුද්ගලයෙකුගේ හෝ වෙනයම් දේශපාලන කටයුතු සඳහා භාවිත කල නොහැකිය.

(2) බලමණ්ඩලයේ සාමාජිකාවක් යම් පළාත් පාලන, පළාත් සභා සහ පාර්ලිමේන්තු මැතිවරණයකට ඉදිරිපත් වී එහි සභිකයෙක් ලෙස තේරීපත් වූ විට එම සාමාජිකයාට තව දුරටත් කාරක සභාවේ සාමාජිකත්වය දැරිය නොහැකිය. එවිට එම තනතුර පුරප්පාඩුව පවතින අතර, වාරය අවසන් වන තෙක් කමිටුවේ වෙනත් සාමාජිකයෙකු මඟින් එම තනතුරෙහි කටයුතු ආවරණය කරනු ලැබේ.

(3) බලමණ්ඩලයේ සාමාජිකාවක් යම් පළාත් පාලන, පළාත් සභා සහ පාර්ලිමේන්තු මැතිවරණයකට නාම යෝජනා භාරදුන් පසු, එම සාමාජිකයාට කාරක සභාවේ සාමාජිකයකු විය නොහැක. ඇය දැනටමත් නිලධාරී මණ්ඩලයේ නිලධාරියෙක් නම්, එම තනතුර පුරප්පාඩුව පවතින අතර, වාරය අවසන් වන තෙක් කමිටුවේ වෙනත් සාමාජිකයෙකු මගින් එම තනතුරෙහි කටයුතු ආවරණය කරනු ලැබේ.

## 9. ලියාපදිංචිය

නව බලමණ්ඩලයක් ස්ථාපනය කිරීමේදී එකී බලමණ්ඩලය ලියාපදිංචිය සිදුකිරීමට පහත සඳහන් ලේඛන කාන්තා කාර්යාංශයේ අධ්‍යක්ෂක වෙත භාරදිය යුතුය.

(1) මහ සභාවේ අනුමැතිය ලබාගත් හා බලමණ්ඩල ලේකම් හා සභාපති විසින් අත්සන් යොදා ඇති බලමණ්ඩල ව්‍යවස්ථාවේ පිටපතක්. (ඇමුණුම්අංක I දක්වා ඇති පරිදි)

(2) බලමණ්ඩලය සඳහා නිලධාරීන් පත්කර ගත් විස්තර සමග මහ සභා රැස්වීම් වාර්තාව. (ඇමුණුම්අංක II වේ) (බලමණ්ඩලයට කාන්තා අභිවෘද්ධිය හා සාමාජික දියුණුව උදෙසා ඕනෑම රාජ්‍ය, රාජ්‍ය නොවන මෙන්ම ජාත්‍යන්තර ආයතන සමග හවුල්කරිත්වයෙන් වැඩකල හැකිය)

**ඇමුණුම්අංක I**

## ජාතික කාන්තා බලමණ්ඩල ව්‍යවස්ථාව සම්මතකර ගැනීම

සාමාජිකාවන් ....පමණ සහභාගීවූ 202...මස ...දින පැවති මහ සභාවේදී බලමණ්ඩල ව්‍යවස්ථාව සම්මත කරගනු ලැබූ බව දන්වමි.

ගරුසභාපති

දිනය :

ගරුලේකම්

දිනය :

<u>බැංකුගිණුම</u>

බැංකුශාඛාව: ________________________________________

ගිණුම්අංකය: ________________________________________

වර්තමානශේෂය: ________________________________________

ජාතික මට්ටමේ බලපැවැත්වෙන අදාල ජාතික කාන්තා බලමණ්ඩල තොරතුරු නිවැරදි බවත් ලියාපදිංචිය සඳහා නිර්දේශ කරමු

__________________________

අධ්‍යක්ෂ,කාන්තාකාර්යාංශය

__________________________

ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

රබර්මුද්‍රාව

**ඇමුණුම්අංක II**

## ලියාපදිංචිය සඳහා අවශ්‍ය මහ සභා රැස්වීම් වාර්තාව

1. ස්ථානය
2. ජාතික බලමණ්ඩලය යටතේ ඇති කාන්තා කාර්ය සංවිධාන ප්‍රමාණය
3. ජාතික බලමණ්ඩලයේ නම
4. මෙයට පෙර ජාතික බලමණ්ඩලය කාන්තා කාර්යාංශය තුල ලියපදිංචිවී ඇත්නම් එම ලියාපදිංචි අංකය:
5. නිලධාරී මණ්ඩලයේ නාම ලේකනය

| තනතුරනම | නම | ලිපිනය | දුරකථනඅංකය# | අත්සන |
|---|---|---|---|---|
| සභාපති | | | | |
| උපසභාපති | | | | |
| ලේකම් | | | | |
| සහකාරලේකම් | | | | |
| භාණ්ඩාගාරික | | | | |
| කමිටුසාමාජික 1 | | | | |
| කමිටුසාමාජික 2 | | | | |
| කමිටුසාමාජික 3 | | | | |
| උපදේශිකාව 1 | | | | |
| උපදේශිකාව 2 | | | | |
| කාන්තා කාර්යන්ශයේ අධ්‍යක්ෂ/හෝ ඔහුගේ/ඇයගේ නියෝජිතයෙකු | | | | |

(1) ජාතික කාන්තා බල මණ්ඩල නිලධාරීන් පත්කර ගැනීමේ නිලවරණය 202.......මස….(දින) කාන්තා කාර්යාංශය,අධ්‍යක්ෂ හෝ/ඇය/ඔහුගේ බලයලත් නිලධාරියෙක් ............................................යන නම් දරණ විසින් එය නිරීක්ෂණය කරන ලදී .

*නම, ලිපිනය, ග්‍රා, නි. කො,දුරකථන අංකය සහ අත්සන සාමාජිකාවන්ගේ නාම ලේඛනය අමුණාඇත.

(2) ව්‍යවස්ථාව අනුමත කිරීම

(3) ජාතික බලමණ්ඩල ව්‍යවස්ථාව යෝජනා කර බලමණ්ඩල කාන්තාවන් හා කාන්තා කාර්යාංශය,අධ්‍යක්ෂ විසින් එකග වුහ.

(4) කාන්තා කාර්ය සංවිධාන මගින් කරනු ලබන තැන්පතු

(5) තැන්පත් කරන මුදල්රු________________ බව සියලු සාමාජිකාවන්යෝජනා කර එකග වුහ.

(6) සාකච්ඡා කල වෙනත් කරුණු

**විමසීම්:**

ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය

කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය

3 වන මහල, සෙත්සිරිපාය (II අදියර), බත්තරමුල්ල.

දුරකථන: 0112187270 | 0112187271